


# සජ්දා

සජ්දා යන පදයේ අර්ථය හිස නැමීම යන්න ය. සිරස පොළොව මත තබා අල්ලාහ් වෙනුවෙන් තම අවනත බව දක්වා සිටීම මෙයින් අදහස් කෙරේ. මෙමගින් අල්ලාහ් ඉතා ම ආසන්න බව හැඟවේ. මෙය සලාතයේ ඉතා ම වැදගත් අවස්ථාවයි. සලාතයේ අල්ලාහ් ඉතා ම කැමැති ක්‍රියාව මෙයයි. මෙහි වැදගත්කම නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා විවිධ අවස්ථාවල පවසා ඇත.

"ගැත්තා අල්ලාහ්ට ඉතා ම කිට්ටුව සිටින අවස්ථාව සුජූදය වන්නේ ය. එනිසා සුජූද් අවස්ථාවේ දී වැඩියෙන් ප්‍රාර්ථනා කරන්න."

"ඔබ අල්ලාහ් වෙනුවෙන් වැඩියෙන් සුජූද ඉටු කරන්න. මක්නිසා ද යත් ඔබ කරන එක් සුජූදයක් මගින් අල්ලාහ් ඔබගේ තත්ත්වය උසස් කරන්නේ ය. ඔබගේ පාපයන්ට සමාව දෙන්නේ ය."

ෆර්ල් වූ සලාතයේ දී මෙන් ම සුන්නත් වූ සලාතයේ දී අප ඉටු කරන සජ්දා අනිවාර්යයෙන් ඉටු කළ යුතු ෆර්ල් වර්ගයට අයත් සජ්දා ය. සලාත නොවන අවස්ථාවල ද සජ්දා ඉටු කෙරේ. ඒවා සුන්නත් වූ සජ්දා ය. ඒවා **සජ්දා තිලාවත්, සජ්දා සහ්වූ, සජ්දා ෂුක්ර්** ආදියයි. සජ්දා තිලාවත්, සජ්දා සහ්වූ යන දෙක ම වුලූඃ සමග ඉටු කිරීම අවශ්‍ය වේ. සජ්දාවට අයත් අවයව හතකි ඒවා නම් නළල, දෙ අත්ල, දණහිස් දෙක, දෙපතුල්වල ඉදිරි පෙදෙස් යන හත වේ.

## සජ්දා තිලාවත්

අල් කුර්ආනයේ ස්ථාන 15ක සජදා සහිත ආයත දක්නට ඇත. එය පාරායනා කරන්නා හා පාරායනය ශ්‍රවණය කරන්නා සජදා කිරීම සුන්නත් වූ ඉබාදකයකි. මෙය සජ්දා තිලාවත් නම් වේ. උදාහරණ වශයෙන් සූරතුල් හජ්හි 77 වන වැකිය මෙසේ ය.

"විශ්වාසවන්තයිනි, ඔබ සිරස නමා සුජූද් කර කර ඔබගේ දෙවියන් නමදින්න" (22:77)

මෙහි වැදගත්කම පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මෙසේ පවසා ඇත.

"මිනිසෙකු සජ්දවට අදළ ආයතය පාරායනය කර සුජූද් කරන විට ෂයිතාන්, මගේ අවාසනාව සුජූද් කරන ලෙස මිනිසාට අණ කරනු ලැබූ විට ඔහු සුජූද් කර ස්වර්ගය හිමිකර ගත්තේ ය. සුජූද් කරන ලෙස මා හට අණ කරනු ලැබූ විට මම සුජූද් කිරීම ප්‍රතික්ෂේප කළෙමි. මෙනිසා නිරයට අයත් වූවකු වූයෙමි" යි යැයි කියමින් ෂයිතාන් අඬමින් එතැනින් ඉවත් ව යයි. (මුස්ලිම්)

සලාතයේ දී සජ්දවට අදළ ආයතයක් පාරායනය කළ විට සජ්ද කිරීම සුන්නතයකි. ජමාඅත් සලාතයේ දී ඉමාම් පාරායනය කළ විට, ඉමාම් සමඟ මඃමූම්වරුන් ද සජ්දා කළ යුතු ය. සජ්ද තිලාවත් කරමියි සිතේ සිතාගෙන තක්බීර් පවසා සුජූදයට යා යුතු ය. සුජූද් කළ පසු තක්බීර් පවසා නැවත නියමිත අවස්ථාවට පැමිණිය යුතු ය. ඉතිරි ව ඇති ආයත පාරායනය කර නියමිත පරිදි සලාතය සම්පූර්ණ කළ යුතු ය.

සලාත නොවන අවස්ථාවල සජ්දවට අදාළ ආයතයක් පාරායනය කළේ නම්, නැතහොත් සවන් දුන්නේ නම් අල්ලාහ් වෙනුවෙන් සජ්ද ඉටුකරමියි කියා සිතාගෙන සජදව ඉටු කළ යුතු ය. සජ්ද තිලාවත් අවස්ථාවේ දී ඒ සඳහා පාරායනය කළ යුතු විශේෂ දුආව පාරායනය කළ හැකි ය. වෙනත් බොහෝ දුආ ද ඇත.

## සජ්ද සහ්වු

මෙහි අදහස, අමතක වීම සඳහා වන සුජූද යන්න ය. සලාතයේ දී යමක් වැරදීමකින් වැඩිපුර කළ විට නැතහොත් යමක් අමතක වීම නිසා අතහැරුණු විට හෝ නැතහොත් යම් ක්‍රියාවක් ගැන සැකයක් පහළ වූ විට හෝ ඒ සඳහා ඉටු කළ යුතු සුජූද දෙක මෙයින් අදහස් කෙරෙන්නේ ය. පහත අවස්ථාවන් මෙයට උදාහරණ ලෙස දැක්විය හැකි ය.

01. අබ් ආල් සුන්නතයන්ගෙන් එකක් අමතක වීමකින් අත් හැරීම (උදාහරණ: පළමු අත්තහියියාතය අතහැරීම)

02. සලාතය බිඳවන ක්‍රියාවක් අමතක වීමකින් කිරීම (උදාහරණය : රක්අත් හතරක සලාතය රක්අත් පහක් ලෙස ඉටු කිරීම, සලාතයේ දී කතා කිරීම)

03. සලාතයේ දී සැකයක් ඇති වීම (උදාහරණ: සලාතයේ දී රක්අත් කීයක් ඉටු කළා දැයි සැක කිරීම) මෙසේ සැකයක් ඇති වූයේ නම් අවම සංඛ්‍යාවක් ඉටු කළ බව සලකා සලාතය සම්පූර්ණ කළ යුතු ය. පසුව අත්තහියියාත් පාරායනය කර සලාම් කීමට පෙර සජ්දා සහ්වු කළ යුතු ය.

## සජ්දා ෂුකුර්

මෙය ස්තුති පළ කිරීමේ සජ්දාවක් ලෙස හැඳින්විය හැකි ය. මෙය ද සුන්නත් වූ ක්‍රියාවකි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට සතුටුදායක ආරංචියක් ලැබුණු විට නැතහොත් යම් කටයුත්තක් පහසුවෙන් කර ගත හැකි වුවහොත් නැතහොත් අනතුරකින් ආරක්ෂාව ලැබුණු විට අල්ලාහ්ට ස්තුති කිරීමක් ලෙස සජ්දා කරන්නේ ය. එම නිසා අපට සතුටුදායක ආරංචියක් ලැබුණු විට හෝ යමක් අපට පහසුවෙන් කර ගත හැකි වූ විට හෝ අනතුරකින් ආරක්ෂාව ලැබූ විට සජ්දා කිරීම යහපත් ක්‍රියාවකි.

සජ්දා ෂුකුර් ඉටු කරමියි යන නියියතය සමඟ තක්බීර් පවසා සුජූදයක් ඉටු කළ යුතු ය. සජ්දාවට අයත් අවයව හත ම පොළොව ස්පර්ශ කරන අයුරින් සජ්දාව ඉටු කළ යුතු ය.

**සජ්දා පිළිබඳ ව විස්තරාත්මක ව දැන ගත් අපි ඒවා අප ජීවිතයේ දී අනුගමනය කරමු.**



පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

سُجُودٌ سَجْدَةُ تِلَاوَةٍ سَجْدَةُ شُكْرٍ سَجْدَةُ سَهْوٍ

**අභ්‍යාස**

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

හරි නම් (✓) ලකුණ ද වැරැදි නම් (×) ලකුණ ද යොදන්න.

1. අ) අල් කුර්ආනයේ ස්ථාන 36ක සජ්දා ඇත. ( )

ආ) සියලු ම සජ්දා ඉටු කිරීමට වුලූඃ කිරීම අනිවාර්ය වේ. ( )

ඇ) ගැත්තා අල්ලාහ්ට ඉතාමත් කිට්ටුවෙන් සිටින්නේ රුකූවේ දී ය. ( )

ඈ) විභාගයේ දී සමත්වීම වෙනුවෙන් ඉටු කළ යුත්තේ සජ්දා සහ්වු ය. ( )

ඉ) සිකුරාදා දින සුබ්හු සලාතයේ දී දෙවන රක්අතයේ දී සජ්දා ඉටු කිරීම අනිවාර්ය වේ. ( )

2. සජ්දා යන්නෙහි තේරුම කුමක් ද?

3. තිලාවත් යනු කුමක් ද?

4. සජ්දාවෙහි වැදගත්කම පිළිබඳ හදීස් උපදෙස් තුනක් ඉදිරිපත් කරන්න.

5. ඔබගේ ජීවිතයේ සජ්දා ෂුකුර් කිරීමට ලද අවස්ථා තුනක් ලියන්න.